බලශක්ති අමාත්‍යාංශය

# පුරප්පාඩු දැන්වීම

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ඔබගේ සුනිත්‍ය බලශක්ති වෘත්තීමය ගවේෂණයේ ඇරඹුම අදයි....

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතා වර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනය හා එක්වන්න. පෘථිවිය කාළගුණ විපර්යාස ව්‍යවසනයකින් ගලවා ගැනීමට බලශක්ති සංක්‍රාන්තිය මෙහෙයවන සුවිශේෂී වෘත්තීය එකමුතුවටයි මේ ආරාධනය....!

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා එක්වන්න

පහත සඳහන් තනතුරු සඳහා සුදුසු සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. රජය විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් යටතේ ස්ථිර සේවක සංඛ්‍යාවට පත්වීම් සිදු කරනු ලැබේ.

**<u>සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)- තනතුරු 14</u>**

**සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදුලි/යාන්ත්‍රික/රසායනික හා ක්‍රියාවලි/නිෂ්පාදන හෝ බලශක්තියට අදාළ ක්ෂේත්‍රවල ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

වැටුප් පරිමාණය : MM 1-1 -2025 : Rs. 91,690-2,480x10-3,450x15-168,240

<u>තාක්ෂණික සහකාර</u>

**(විදුලි / යාන්ත්‍රික / සිවිල් / රසායනික හා ක්‍රියාවලි) - තනතුරු 07**
***(මෙයින් තනතුරු 05 ක් හම්බන්තොට, සෙවනගල සහ ඇඹිලිපිටිය ප්‍රදේශයේ ක්‍රියාත්මක සූර්ය බලාගාර සඳහා වේ).**

**(තොරතුරු තාක්ෂණික) - තනතුරු 02**

**සුදුසුකම් හා පළපුරුද්ද**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) 5 ට නොඅඩු අදාළ ඩිප්ලෝමාවක්/ සහතිකයක් ලබා තිබීම.

වැටුප් පරිමාණය: MA2-2-2025: Rs. 50,540-540x10-630x7-1080x4-1280x20-90,270

**සියලුම තනතුරු සඳහා වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ට අදාළ නොවේ.)

**අයදුම් කළ යුතු ආකාරය:**

ඥාති සම්බන්ධතා නොමැති නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම, ලිපිනය සහ දුරකථන අංක සහිත ජීව දත්ත ඇතුළත් අයදුම්පත්, අදාළ සියලුම සහතිකවල සහතික කළ පිටපත් සහිතව, 2025 ජූලි 31 වන දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, අංක 80, සර් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිවිය යුතුය

රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
අංක 80, සර් අර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 07.
2025.07.11

**තිරසාර හා බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්**